## ඩී. එල්. ඩී. ක්‍රිශාන්ත එ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/900/19 (2019.05.07 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය)**,** රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - ඩී. එල්. ඩී. ක්‍රිශාන්ත
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරි, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**පෙනීසිටීම**

අභියාචක - ඩී. එල්. ඩී. ක්‍රිශාන්ත
පොදු අධිකාරිය - එච්. ජේ. එම්. සී. ඒ. ජයසුන්දර, තොරතුරු නිලධාරී - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ඩී. එම්. හීනටිගල, කළමනාකරණ සහාකාර

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.05.04 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.05.31 |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.07.04 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.10.08 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2018.05.04 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

*"බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ II පෙළ , ජේලර්. II පෙළ සුභ සාධක නිලධාරි තනතුර උසස් කිරීම සඳහා 2013 (2014) පැවැත්වූ විභාගයේ සම්පූර්ණ ප්‍රතිඵල ලේඛනයක්."*

තොරතුරු නිලධාරියා 2018.05.31 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ ප්‍රතිඵල ලකුණු අනු පිළිවෙලකට සකසා නොමැති බවයි. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2018.07.04 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2018.10.08 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරිය කරුණු දක්වමින් පවසා සිටියේ අභියාචක විසින් ඉල්ලීම් කර ඇති ප්‍රතිඵල ලේඛනය, පොදු අධිකාරිය විසින් බන්ධනාගාර දෙපාර්තුමේන්තුවේ විභාග ඉල්ලුම්කරුවන්ගේ විභාග අංකය අනුපිළිවෙලට සකස් කොට අභියාචකට ලබා දී ඇති බවයි. පොදු අධිකාරිය තවදුරටත් කරුණු දක්වමින් පවසා සිටියේ අනෙකුත් විභාග ඉල්ලුම්කරුවන්ගේ නම් සහිතව ලකුණු ලේඛනයක් ලබාදීම ඔවුන්ගේ පෞද්ගලිකත්වයට හානි සිදු කරන බැවින් එම ලකුණු ලබාදීමට නොහැකි බවත් ය.

මෙහිදී කොමිෂන් සභාව කියාසිටියේ මෙවැනි ප්‍රතිඵල ලේඛනයන් පනත යටතේ පොදු දේපලක් වන බවත්, මීට පෙර අභියාචනා අවස්ථා කීපයකදීම කොමිෂන් සභාව විභාග ලකුණු ලබා දීමට නියෝගයන් නිකුත් කර ඇති බවයි. පොදු අධිකාරිය ප්‍රතිචාර දක්වමින් පවසා සිටියේ, මෙහිදී ප්‍රශ්නගත වන විභාගය සෑම පුද්ගලයෙකුටම පොදු විභාගයක් නොවන බවත්, විභාගය 900ක් පමණ ඉල්ලුම්කරුවන් විසින් ලියා ඇති හෙයින් එක් එක් පුගලයෙකුගේ ලකුණු වෙන් වෙන් වශයෙන් ලබා දීම ඔවුන්ගේ පෞද්ගලිකත්වයට හානි සිදු කරන බවයි.

**නියෝගය:**

කොමිෂන් සභාව වීසින් අභියාචක ලබා ගෙන ඇති ලකුණු අභියාචකට ලබා දෙන ලෙසටත්, සෙසු ඉල්ලුම්කරුවන්ගේ ලකුණු පනත ප්‍රකාරව ප්‍රතික්ෂේප කිරීමට හේතු ලිඛිත දේශනයක් මඟින් මාසයක කාලයක් ඇතුලත කොමිෂන් සභාව දැනුවත් කිරීමටත් පොදු අධිකාරියට මෙයින් නියෝග කෙරෙනු ලැබේ. තවද, අභියාචකට එම ලිඛිත දේශනයට ප්‍රතිඋත්තරයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා මාසයක කාලයක් ලබා දෙනු ලැබේ.

අභියාචනය කල් තබන ලදී.
මීළඟ කැඳවීම් දිනය: 13.08.2019

---

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/900/19 (2019.08.13 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**පෙනීසිටීම**

අභියාචක - ඩී. එල්. ඩී. ක්‍රිශාන්ත
පොදු අධිකාරිය - පැමිණ නැත

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරිය පෙනී සිටියේ නැත.

කොමිෂන් සභාව විසින් මිට පෙර අභියාචනය විභාග කිරීමේදී උද්ගත වූ කාරනා නැවත විමසීම් කිරීමේදී හෙළිදරව් වුයේ පොදු අධිකාරිය සතුව ඇති ලකුණු ලේඛනය අනුපිළිවලට සකස් නොකළ ලේඛනයක් බවත් එය අභියාචකට ලබා නොදී ඇති බවත්ය.

අභියාචක ප්‍රශ්න කිරීමේදී පවසා සිටියේ මෙම විභාගය විවෘත තරඟ විභාගයක් නොවන බවත් රජයේ සේවකයන් විසින් ලිඛිත විභාගයක් හෙයින් මෙහි ප්‍රතිඵල එම විභාගයට මුහුණ දුන් සෑම පුද්ගලයෙකුටම ලබාගැනීමට හැකියාවක් ඇති බවය. කොමිෂන් සභාව මෙහිදී මෙම විභාගයේ ලකුණු මිට පෙර අවස්ථාවන්හිදී සියලුම විභාගකරුවන්ට ලබා දී ඇති බව ඔප්පු කිරීම සඳහා ලිඛිත ප්‍රකාශනයන් ඇත්දැයි අභියාචකගෙන් විමසන ලදී. නමුත් අභියාචක සතුව එවැනි ලිඛිත ප්‍ර කාශනයක් මෙම අවස්ථාවේ නොමැති බව පෙන්වා දෙන ලදී.

පොදු අධිකාරිය විසින් 2019.05.17 දිනැති ලිඛිත දේශනයෙන් ගෙනහැර දැක්වූ කරුණු පිලිබඳ මෙම විභාග කිරීමේදී සාකච්ඡා කරන ලදී. ඒ අනුව:

> "ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් ලබන සියලුම ආයතනික විභාග සම්බන්ධයෙන් අදාළ ආයතනය සමඟ ඇති කරගන්නාවූ එකඟතාවයන් අනුව පමණක් ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කරන අතර මීට පෙර අවස්ථා වලදී බන්ධානාගාර දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වූ විභාග වලද ප්‍රතිඵල වල සම්පූර්ණ ලේඛනය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වරයා වෙත පමණක් නිකුත් කිරීමට කටයුතු කර ඇත."

අභියාචක විසින් මෙම ලිඛිත දේශනයට පිළිතුරු 2019.07.12 දින ඉදිරිපත් කර ඇති අතර, ඒ අනුව:

> *"... මා විසින් විභාග කොමසාරිස් ජනරාල්වරයාගෙන් ඉල්ලා ඇති විභාග ප්‍රතිඵල මා හට ලබා දීම ප්‍රතික්ෂේප කරමින් එතුමා විසින් ඉදිරිපත් කර ඇති කරුණු මා පෞද්ගලිකව පිළිනොගන්නා බව කරුණාවෙන් සඳහන් කර සිටිමි. එබැවින් මේ සම්බන්ධව ඔබ තුමාගෙ පරීක්ෂණයකින් පසු මා වෙත එය ලබා දීමට අවශ්‍ය කටයුතු කර දෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.*
>
> *තවද විභාග කොමසාරිස් ජනරාල් තුමාගේ ලිපියේ තුන්වන ඡේදයට අනුව බන්ධනාගාර කොමසාරිස් ජනරාල්තුමාගේ එකඟතාවය මත විභාග ප්‍රතිඵල ලේඛනයක් එතුමාට ලබා දී ඇති බව සඳහන් කර ඇත. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්තුමාට එකඟතාවය මත ප්‍රතිඵල ලේඛනයක් ලබාදීම හා විභාග අපේක්ෂකයෙකුට එය ලබා නොදීම කුමන නීතිමය*

*ප්‍රතිපාදනයක් යටතේ කරන්නේද යන්න ගැටලු සහගත කරුණකි. මා විශ්වාස කරන්නේ සත්‍ය වසන් කිරීමට කරනු ලබන උත්සාහයක් බවයි. එය ඔබතුමාට වැටහෙනු ඇති මම තරයේ විශ්වාස කරමි. ඔබතුමාගේ ලිපියේ සඳහන් අන් කරුණු ද කිසිසේත් පිළිගත නොහැකි තත්වයක පසුවන බව මා ප්‍රකාශ කර සිටිමි. ඕනෑම පුද්ගලයෙකුට තොරතුරු ලබාගැනීමේ පනත යටතේ විශේෂයෙන්ම විභාග ප්‍රතිඵල ලේඛනයක් ඉල්ලා සිටීමටත්, එය ලබාදීමටත් අදාළ පනත යටතේ නීතිමය ප්‍රතිපාදන ඇති බැවින්, තවද විභාග කොමසාරිස් ජනරාල්තුමා කවරෙකුට හෝ නිකුත් කර ඇති විභාග ප්‍රතිඵල ලේඛනයක් නීතිමය ප්‍රතිපාදන යටතේ නැවත වරක් පිටපතක් ඉල්ලුම් කිරීමේදී පිළිගැනීමට නොහැකි කරුණු ඉදිරිපත් කරමින් එය ප්‍රතික්ෂේප කිරීම නීති විරෝධී කටයුත්තක් වනවා පමණක් නොව සත්‍ය වසන් කිරීමට ගන්නා උත්සහයක් බව ඔබතුමාට වැටහෙනු ඇතැයි මා තරයේ විශ්වාස කර සිටිමි."*

කොමිෂන් සභාව ප්‍රශ්න කිරීමේදී තමාට අනුපිළිවලට සකස් කරන ලද හෝ නොකරන ලද ලැයිස්තුවෙන් ඕනෑම ලැයිස්තුවක් පොදු ලේඛනයක් ආකාරයෙන් ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලීම් කරන ලදී.

**නියෝගය:**

මීළඟ කැඳවීම් දිනයේදී පෙනී සිටින මෙන් පොදු අධිකාරියට මෙයින් නියෝග කරනු ලැබේ. තවද කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමට අපොහොසත් වීම පනතේ 39 වගන්තිය ප්‍රකාරව දඬුවම් ලැබිය හැකි වරදක් යන්නට පොදු අධිකාරියෙහි අවධානය යොමු කරනු ලැබේ

මෙම තොරතුරු ඉල්ලීම මඟින් ඉල්ලීම් කරන්නාවූ ලකුණු ලැයිස්තුව පොදු ලේඛනයක්ද යන්න තහවුරු කිරීම සඳහා ලිඛිත දේශනයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙසට අභියාචකට මෙයින් නියෝග කරනු ලැබේ.

අභියාචනය කල් තබන ලදී.
මීළඟ කැඳවීම් දිනය: 08.10.2019
*******